සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education – Western Province

දෙවන වාර ඇගයීම
இரண்டாம் தவணை பரீட்சை - 2019
Second Term Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: ගණිතය | පත්‍රය / வினாத்தாள் / Paper: II | කාලය / காலம் / Time: පැය 03 යි. |

◈ A කොටසින් ප්‍රශ්න 5 ක් ද B කොටසින් ප්‍රශ්න 5 ක් ද තෝරාගෙන ප්‍රශ්න දහයකට පිළිතුරු සපයන්න.

◈ එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් මෙම ප්‍රශ්න පත්‍රයට ලකුණු 100 ක් හිමි වේ.

## A කොටස

ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

**01. (a)** $y = x^2 - 3$ ශ්‍රිතයේ ප්‍රස්තාරය ඇඳීමට පිළියෙල කළ අගය වගුවක් පහත දැක් වේ.

| $x$ | $-3$ | $-2$ | $-1$ | $0$ | $1$ | $2$ | $3$ |
|---|---|---|---|---|---|---|---|
| y | 6 | 1 | ........ | $-3$ | $-2$ | 1 | 6 |

**(i)** $x = -1$ විට y හි අගය සොයන්න.

**(ii)** ප්‍රස්තාර කඩදාසියක් මත සුදුසු පරිමාණයකට ඉහත ශ්‍රිතයේ ප්‍රස්තාරය අඳින්න.

**(iii)** ප්‍රස්තාරය ඇසුරෙන් හැරුම් ලක්ෂයේ ඛණ්ඩාංකය ලියන්න.

**(iv)** ප්‍රස්තාරය ඇසුරෙන් $x^2 - 3 = 0$ හි මූල සොයන්න.

**(b)** $(0, 2)$ හා $(2, 8)$ ලක්ෂ්‍යයන් හරහා යන සරල රේඛාවේ සමීකරණය ලියා දක්වන්න.

**02. (a)** ව්‍යාපාරික ස්ථානයක් වෙනුවෙන් එහි අයිතිකරු කාර්තුවකට රුපියල් 1 200 ක වරිපනම් බදු මුදලක් අදාල පළාත් පාලන ආයතනයට ගෙවිය යුතුය.

**(i)** ගෙවිය යුතු වාර්ෂික වරිපනම් බදු මුදල සොයන්න.

**(ii)** ව්‍යාපාරික ස්ථානයේ වාර්ෂික තක්සේරු වටිනාකම රුපියල් 60 000 ක් නම් අය කරන වාර්ෂික වරිපනම් බදු ප්‍රතිශතය කොපමණද?

**(b)** දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව 2016 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරන ආදායම් බදු ගණනය කිරීමේ ප්‍රතිශත පහත වගුවේ දැක්වා ඇත.

| වාර්ෂික ආදායම (රු.) | බදු ප්‍රතිශතය |
|---|---|
| පළමු රු. 500 000 | 0% |
| ඊළඟ රු. 500 000 | 4% |
| ඊළඟ රු. 500 000 | 8% |

**(i)** රුපියල් 1 050 000 ක වාර්ෂික ආදායමක් ඇති පුද්ගලයකු ගෙවිය යුතු වාර්ෂික ආදායම් බදු මුදල ගණනය කරන්න.

**(ii)** රුපියල් 48 000 ක් වාර්ෂික ආදායම් බදු මුදල් ලෙස ගෙවීමට සිදු වූ පුද්ගලයකුගේ වාර්ෂික ආදායම කොපමණද?

**03.** **(i)** $(x+\text{m})^2 = x^2 + 6x + \text{n}$ නම්, m හා n හි අගය සොයන්න.

**(ii)** සාධක වෙන් කරන්න. $a^3 - 9ab^2$

**(iii)** විසඳන්න.

$$2x - \text{y} = 5$$

$$x + 3\text{y} = 13$$

**04.** තිරස් බිමක පිහිටි P , Q හා R නම් ලක්ෂ්‍ය තුනක දළ පිහිටුම් දැක්වෙන සටහනක් රූපයේ දැක්වේ. සුදුසු පරිමාණයක් තෝරාගෙන P , Q හා R ලක්ෂ්‍යවල පිහිටුම් සහිත පරිමාණ රූපයක් අඳින්න. පරිමාණ රූපය ඇසුරින් P සිට Q ට ඇති දුර හා Q සිට P හි දිගංශය මැන ලියන්න.




To download past papers visit
www.vajirapani.blogspot.com

**05.** මිරිස් පාත්තියක වූ පැල 25 කින් කඩා ගන්නා ලද මිරිස් කරල් ගණන පහත දැක් වේ.

5 , 7 , 9 , 9 , 6 , 10 , 7 , 6 , 8 , 8 , 9 , 6 , 9
10 , 9 , 5 , 7 , 8 , 10 , 8 , 8 , 6 , 10 , 9 , 5

**(i)** ඉහත තොරතුරු ඇසුරින් පහත දී ඇති වගුව උත්තර පත්‍රයට පිටපත් කරගෙන හිස්තැන් සම්පූර්ණ කරන්න.

| මිරිස් කරල් ගණන ($x$) | ප්‍රගණනය | පැල ගණන ($f$) | $f \times x$ |
|---|---|---|---|
| 5 | | | |
| 6 | | | |
| 7 | | | |
| 8 | | | |
| 9 | | | |
| 10 | | | |
| | | $\sum f =$ | $\sum fx =$ |

**(ii)** මෙම සංඛ්‍යාත ව්‍යාප්තියේ මාතය කුමක්ද?

**(iii)** ගසකින් කඩන ලද මිරිස් කරල් ගණනේ මධ්‍යන්‍යය සොයන්න.

**06.** **(i)** $\frac{4}{a+1} = 2 - \frac{3}{a}$ බව දී ඇත්නම් එමගින් $2a^2 - 5a - 3 = 0$ ලබාගත හැකි බව පෙන්වන්න.

**(ii)** $2a^2 - 5a - 3 = 0$ සමීකරණය විසඳීමෙන් $a$ සඳහා අගයන් දෙකක් ලැබෙන බව පෙන්වන්න.

## B කොටස

**ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

**07.** **(i)** $log_5 2 = a$ නම් $log_5 10$ හි අගය $a$ ඇසුරින් ලියන්න.

**(ii)** විසඳන්න. $log_a x - log_a 5 = log_a 3$

**(ii)** ලඝු ගණක වගු භාවිතයෙන් අගය සොයන්න. $\frac{6.914 \times 3.076}{8.619}$

**08.** පහත දැක්වෙන නිර්මාණ සඳහා cm / mm පරිමාණයක් සහිත සරල දාරයක් හා කවකටුවක් පමණක් භාවිත කරන්න. නිර්මාණ රේඛා පැහැදිලිව දක්වන්න.

**(i)** AB = 5 cm , AD = 5 cm හා $B\hat{A}D = 60°$ වන පරිදි ABD ත්‍රිකෝණය නිර්මාණය කරන්න.

**(ii)** $B\hat{A}D$ හි සමච්ඡේදකය නිර්මාණය කරන්න. එම සමච්ඡේදකය BD පාදය හමුවන ලක්ෂ්‍යය X ලෙස නම් කරන්න.

**(iii)** දික්කළ AX මත C පිහිටන සේ ද, AX = XC වන සේ ද ABCD චතුරස්‍රය නිර්මාණය කරන්න.

**(iv)** BC දිග මැන ලියන්න.

**(v)** ABCD චතුරස්‍රය හැඳින්විය හැකි විශේෂ නාමය කුමක්ද?

To download past papers visit
www.vajirapani.blogspot.com

**09.** ABC ත්‍රිකෝණයේ $A\hat{C}B = 3A\hat{B}C$ වේ. $B\hat{A}C$ හි සමච්ඡේදකයට BC පාදය E හි දී හමු වේ. දික්කළ AE මත D පිහිටා ඇත්තේ $A\hat{D}B = 90°$ වන පරිදිය. BC මගින් $A\hat{B}D$ සමච්ඡේද වන බව පෙන්වන්න. (ඉඟිය $A\hat{B}C = x$, හා $B\hat{A}D = y$ ලෙස ගන්න.)

**10.** ABC ත්‍රිකෝණයේ $B\hat{A}C$ යේ සමච්ඡේදකය D හි දී BC පාදය සමච්ඡේදනය කරයි. AD = DE වන සේ AD රේඛාව E දක්වා දික්කර ඇත.

**(i)** ඉහත තොරතුරු දළ සටහනක් මඟින් දක්වන්න.

හේතු දක්වමින් පහත ඒවා සාධනය කරන්න.

**(ii)** ABEC සමාන්තරාස්‍රයක් බව

**(iii)** AC = CE බව

**(iv)** ABC සමද්විපාද ත්‍රිකෝණයක් බව

**11.** පාසලක ගණිතාගාරයේ බිත්තියක ඇඳ තිබූ වෘත්ත ඛණ්ඩයක රූප සටහනක් මෙහි දැක් වේ. එහි OX = r ද OA = 2r ද වේ. රූපයේ අඳුරු කළ කොටසේ පරිමිතිය හා වර්ගඵලය පිළිවෙලින් P හා A මඟින් දැක් වේ නම්,




**(i)** $P = r(\pi + 2)$ බව ද

**(ii)** $A = \frac{1}{2}\pi r^2$ බව ද පෙන්වන්න.

**12. (a)** දී ඇති වෙන් රූප සටහනේ දැක්වෙන ε , X හා Y කුලක පහත පරිදි වේ.

ε = {වෛද්‍ය සායනයකට පැමිණි රෝගීන්}

X = {වයස අවුරුදු 40 ට වැඩි රෝගීන්}

Y = {කාන්තා රෝගීන්}




**(i)** වෙන් රූපයේ අඳුරු කර ඇති ප්‍රදේශයෙන් දැක්වෙන පිරිස වචනයෙන් විස්තර කරන්න.

**(ii)** එම පිරිස කුලක අංකනයෙන් ලියා දක්වන්න.

To download past papers visit www.vajirapani.blogspot.com

**(b)** ඉහත සායනයට සහභාගී වූ රෝගීන් පිළිබඳ සංඛ්‍යාත්මක තොරතුරු දැක්වෙන අසම්පූර්ණ වෙන් රූප සටහනක් පහත දැක්වේ.




**(i)** $x$ මඟින් දැක්වෙන පිරිස කුලක සූත්‍ර භාවිතයෙන් හෝ අන් අයුරකින් හෝ ගණනය කරන්න.

**(ii)** මෙම වෙන් රූප සටහන ඔබේ පිළිතුරු පත්‍රයට පිටපත් කරගෙන එය සම්පූර්ණ කරන්න.

**(iii)** මෙම සායනයට සහභාගී වූ රෝගීන් අතුරින් එක් අයෙකු අහඹු ලෙස තෝරා ගතහොත් එම රෝගියා වයස අවුරුදු 40 හෝ ඊට අඩු කාන්තාවක් වීමේ සම්භාවිතාව ලියන්න.